# මාධ්‍ය නිවේදනය

## ශ්‍රම ඉල්ලුම පිළිබඳ සමීක්ෂණය

### ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**දුරකථනය: 011-2147401** **ෆැක්ස්: 011-2147412** **2018 ජනවාරි 03**

රටෙහි පවතින ශ්‍රමබල අවශ්‍යතාව ප්‍රමාණාත්මකව මැන දැක්වීම අභියෝගාත්මක නමුත්, එය ශ්‍රම ඉල්ලුමට අදාලව ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී අත්‍යාවශ්‍ය සාධකයක් වේ. මෙකී අවශ්‍යතාව සපුරාලනු වස් 2017 වර්ෂයේදී ප්‍රථම වරට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ආයතනික සමීක්ෂණයක් මුළු රටම ආවරණය වන පරිදි සිදුකරන ලදි. මෙම සමීක්ෂණය සේවයේ නියුතු පුද්ගල සංඛ්‍යාව 3 ට වැඩි ව්‍යාපාර ආයතන 3500 ක නියැදියක් භාවිතා කරමින් සිදුකරන ලදී. ශ්‍රම ඉල්ලුමට සරිලන පරිදි ශ්‍රම සැපයුම සපුරාලීම පිණිස වෘත්තීය පුහුණු පාඨමාලා, විශ්ව විද්‍යාල වැඩසටහන් ආදිය සැළසුම් කිරීම සඳහා මෙම සමීක්ෂණය මගින් ඒක් රැස් කරනු ලබන දත්ත විශ්ලේෂණය කිරීමෙන් ලැබෙන සංඛ්‍යාතීන් ප්‍රයෝජනවත් වේ.

ශ්‍රම ඉල්ලුම පිළිබද සමීක්ෂණ වාර්තාව - 2017 එළිදැක්වීමේදී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ඒ.ජේ සතරසිංහ මහතා ප්‍රකාශ කර සිටියේ, පෞද්ගලික අංශයේ රැකියාවල මිලියන 5කට ආසන්න සේවක සංඛ්‍යාවක් සේවයේ නියුතුව සිටින අතර රටෙහි විවිධ අංශයන්හි 497,302 ක ඇබෑර්තු සංඛ්‍යාවක් (ඉල්ලුමක්) පවතින බවයි. 2017 වර්ෂයේදී ඉහළම නියුතු සේවක සංඛ්‍යාවක් සේවා අංශයෙන් වාර්තා වන අතර වෘත්තීය කාණ්ඩ සැළකීමේදී වැඩි පිරිසක් වාර්තා වන්නේ “සේවා සහ විකුණුම් සේවක” කාණ්ඩයෙනි.

ඉහළම සේවක ඉල්ලුමක් මහන මැෂින් ක්‍රියාකරුවන් (77,189) සඳහා වාර්තා වන අතර දෙවනුව ආරක්ෂක නියාමකයින් (57,008) සඳහා ඉහළ ඉල්ලුමක් වාර්තා වේ. වෘත්තිකයන් අතර, යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණවේදීන්, ගිණුම්කරණ සහාය වෘත්තිකයින් සහ හෙද වෘත්තිකයින් සඳහා ඉහළ ඉල්ලුමක් පවතී.

වැඩිදුරටත් මෙම සමීක්ෂණය මගින් අනාවරණය වන කරුණු අනුව පෙනී යන්නේ ඉදිරි මාස 12 ක කාලය තුල විධිමත් අංශය තුළ මැහුම් සේවකයන් සහ ඇඳුම් සකසන්නන් 74,000 ක් පමණ සහ වාණිජ හා අලෙවි අංශයේ සේවකයන් 70,000 ක් පමණ සේවයේ යෙදවීමට අදහස් කරනු ලබන බවයි. විධිමත් සහ අවිධිමත් යන අංශ දෙක සඳහාම සපුරාලීමට අපහසු රැකියා පුරප්පාඩු ලෙස ඇගළුම් අංශයේ මහන යන්ත්‍ර ක්‍රියාකරුවන් හඳුනාගෙන ඇත. පෞද්ගලික අංශයේ සේවා යෝජකයන්ට අනුව පළමුවරට රැකියා සොයන්නන් අතර අධ්‍යාපන හා වෘත්තීය පුහුණුව සහිත අයගේ තම රැකියාව ඉටුකිරීම සඳහා සූදානම, වෘත්තීය සහ කාර්මික පුහුණුව පමණක් සහිත අයට වඩා ඉහල මට්ටමක පවතී. කණ්ඩායමක් ලෙස සාමූහිකව වැඩ කිරීමේ හැකියාව සහ වාචික සන්නිවේදන හැකියාව පෞද්ගලික අංශයේ රැකියා අවස්ථා හිමිකර ගැනීම සඳහා වැඩි වශයෙන් අවශ්‍යවන සුදුසු කමක් බැව් මෙම සමීක්ෂණයෙන් අනාවරණය විය. www.statistics.gov.lk/industries වෙබ් අඩවිය තුළින් මෙම සමීක්ෂණය පිළිබඳ සවිස්තර වාර්තාවක් ප්‍රකාශයට පත්කර ඇති බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වැඩිදුරටත් ප්‍රකාශ කරයි.

ආචාර්ය ඒ.ජේ සතරසිංහ
අධ්‍යක්ෂ ජනරාල්